ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம்
Department of Census and Statistics

''සංඛ්‍යාන මන්දිරය''-''சங்கியான மந்திரய''-"Sankyana Mandiraya",
306/71, පොල්දූව පාර, බත්තරමුල්ල.
තැ.පෙ. : 121 බත්තරමුල්ල.
306/71, பொல்தூவ வீதி, பத்தரமுல்லை.
த.பெ.இல. 121 பத்தரமுல்லை.
306/71, Polduwa Road, Battaramulla.
P.O. BOX : 121 Battramulla.


මගේ අංකය / எனது இல. / My No. 2/ Cons/ Sur/2021

ඔබේ අංකය / உமது இல. / Your No.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General 94-011-2147001

දිනය / திகதி / Date 2021.10. 22

ප්‍රිය මහත්මයාණෙනි/ මහත්මියණි,

**<u>ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය - 2021</u>**

වාර්ෂිකව පවත්වනු ලබන ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය සඳහා දත්ත සැපයීමෙන් ඔබ විසින් දෙපාර්තමේන්තුව වෙත දක්වන ලද සහයෝගයට ස්තුතිවන්ත වෙමි.

02. ශ්‍රී ලංකාවේ සංවර්ධනයට අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම සඳහා අදාළ නිල සංඛ්‍යාති සපයනු ලබන ප්‍රධානතම රාජ්‍ය ආයතනය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවයි. ඒ අනුව, ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ ඉතා වැදගත් දර්ශකාංක ගණනය කිරීම සඳහා මෙන්ම, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සංවර්ධනයට අදාළ රජයේ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය වන තොරතුරු එක්රැස් කිරීම සඳහා ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 1993 වසරේ සිට පවත්වනු ලබයි.

03. 2021 සමීක්ෂණය සඳහා දත්ත රැස්කිරීමට, 2020 වර්ෂයේදී ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් අතුරින් නියැදියක් තෝරාගන්නා ලදී. සංඛ්‍යාලේඛන ආඥා පනත යටතේ මෙම තොරතුරු එක්රැස් කරනු ලබන බැවින්, අදාළ තොරතුරු සැපයීම ඔබගෙන් අපේක්ෂා කරන අතර ඔබ විසින් සපයනු ලබන තොරතුරු දෙපාර්තමේන්තුව විසින් අතිශයින්ම රහසිගතව තබාගන්නා බව ද අවධාරණය කරමි. තවද, මෙම තොරතුරු අප රටේ දළ දේශීය නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමට යොදාගන්නා අතර එමගින් ඔබ නියුතුව සිටින ඉදිකිරීම් ක්ෂේත්‍රයෙන් දළ දේශීය නිෂ්පාදනයට ලබාදෙන දායකත්වය ද ගණනය කරනු ලබයි.

**04** මෙම සමීක්ෂණයේදී අප බලාපොරොත්තු වන්නේ 2020 වර්ෂයේදී ඔබ විසින් කරන ලද ඉදිකිරීම් කටයුතුවලට අදාල තොරතුරුය. (2020 ලිත් වර්ෂය හෝ මුදල් වර්ෂය සඳහා)

**ප්‍රශ්නාවලිය සම්පූර්ණ කොට 2021............ දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ, කර්මාන්ත, ඉදිකිරීම්, වෙළඳ හා සේවා අංශය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, නො.306/71, පොල්දූව පාර, බත්තරමුල්ල යන ලිපිනයට තැපැල් කර හෝ 011-2147412 අංකයට ෆැක්ස් මගින් හෝ <u>industries@statistics.gov.lk</u> යන විද්‍යුත් තැපැලට එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.**

අදාළ තොරතුරු නිවැරදිව ලබාදීමෙන් ජාතික වැදගත්කමක් ඇති මෙම කර්තව්‍යයට ඔබගෙන් ලැබෙන සහාය ඉතා අගය කොට සලකමි.
වැඩිදුරටත් පැහැදිලි කර ගැනීම සඳහා,
**011 – 2147401 - යූ.මහේෂ්වරන් - අධ්‍යක්ෂ**
011 – 2147065 / 0714450670 **- ඊ.එම්.එම්.කේ.ඒකනායක මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ**
011 – 2147409 / **0714969515 - ඩී.එන්. මුණසිංහ මිය, සංඛ්‍යාලේඛනඥ**

**ස්තූතියි.**
**මෙයට විශ්වාසී,**

**පී.එම්.පී. අනුර කුමාර**
අධ්‍යක්ෂ ජනරාල්

ඔබේ තොරතුරු සදයි දියුණුව රටේ නිරතුරු - உங்கள் தகவல்கள் நாட்டின் நிரந்தர அபிவிருத்திக்கு


ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் / Head Office 94-011-2147000 / 94-011-2147400
ෆැක්ස්/பக்ஸ்/Fax : 94-011-2147011
E-mail : dgcensus@statistics.gov.lk
Website : www.statistics.gov.lk
Twitter : @lankaSTAT
Mobile App : lankaSTAT